# සමාජානුයෝජන සංකල්පය විමසුමක්

කළුබෝවිටියන සෝරත හිමි

## හැඳින්වීම

සමාජීයකරණය, අනුසංස්කෘත්‍යායනය, සමාජගත වීම යන නම්වලින් ද හැඳින්වෙන සමාජානුයෝජනය (Socialization) යනු සමාජයට අනුගත කිරීමයි. මිනිස් දරුවකු ලොවට බිහි වන්නේ සමාජ (Social) සත්ත්වයකු ලෙස නොව, ස්වාභාවික (Biological) ඓන්ද්‍රියකු වශයෙනි. එසේ උපන් දරුවා සමාජයෙන් විවිධ අත්දැකීම් ආදිය ලබාගනී. එමගින් සමාජයට උචිත ලෙස අනුයෝජනය වේ. පුද්ගලයෙකුගේ පෞරුෂය හැඩ ගැසීම කෙරෙහි උපයුක්ත කරගත හැකි චර්යාධර්ම, ආයතන හා පිළිවෙළ රටා ආදිය සමාජය තුළ නිරතුරුවම හට ගනී. සමාජය තුළම නැති වී නැවත නැවතත් ඇති වේ. මෙම අඛණ්ඩ සමාජ ක්‍රියාකාරිත්වය හමුවේ පුද්ගල හැඩගැස්ම ද වේගයෙන් සිදුවන අතර එහිදී පුද්ගලයා සමාජය තුළින් යම් ඉගෙනීමක් ද ලබා ගනී. එම ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙස සමාජ විද්‍යාඥයෝ හඳුන්වති.

පුද්ගලයා සිය ජීවිත කාලය පුරාවටම මේ ක්‍රියාවලියට යටත්වන අතර ජීවියෙකු වශයෙන් මිනිසාගේ කායික සන්දර්භය සමාජානුයෝජන ක්‍රියාවලියට යටත් වීමට අවශ්‍ය හැකියාව එම තැනැත්තාට ලබා දේ. නිදසුන් ලෙස බිය, නින්ද, කුසගින්න, පිපාසය, වැනි ප්‍රේරණයන් නෛසර්ගික වශයෙන් ළදරුවා තුළ පැවැතීම, අවධානයට යොමු වීමේ දැඩි ආශාවක් තිබීම, තම අවශ්‍යතා පෙන්වාදීම සඳහා යම් සන්නිවේදන ශක්තියක් පිහිටා තිබීම ආදිය දැක්විය හැකිය. මෙබඳු සාධක නිසා ඔහු නිරායාසයෙන්ම සමාජානුයෝජන ක්‍රියාවලියට යටත් වෙයි. ඒ අනුව ස්වාභාවික මිනිසා සමාජීය සත්ත්වයකු කරනු ලබන ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙස හඳුන්වා දිය හැකිය. මේ ගැන විවිධ සමාජ විද්‍යාඥයන් දක්වා ඇති අදහස් විමසා බැලීමෙන් එය අපට වඩාත් පැහැදිලි කර ගත හැකිය.

**සමාජානුයෝජනය යනු**

සමාජානුයෝජනය යනු සංස්කෘතිය පවරාදීමේ ක්‍රියාවලියයි. ඊට විවිධ සාමාජීය සමූහයන්ගේ භාවිතයන්, නීති රීති, ඉගෙනීම් ද ඇතුළත්ය. (Peter Wormley) අමරසේකර, (1987) සමාජයේ බලපවත්වනු ලබන යම් යම් සාරධර්ම, ආකල්ප, අගනාකම්, පිළිබඳ ඉගෙන ගෙන ඒවා තමාගේ චරිතය තුළ අභ්‍යන්තරීකරණය කරගැනීම සමාජානුයෝජනයයි. (Talcott Parsons) අමරසේකර, (1987) සමාජ සමූහයේ ධර්මතාවලට අනුකූලව ජීවත්වීමට පුද්ගලයා ඉගෙන ගන්නේ සමාජානුයෝජන ක්‍රියාවලියෙනි. (W.F. Ogbum) අමරසේකර, (1987) සී.එච්. කූලිගේ කැඩපතේ පිළිරුව න්‍යාය, අර්වින්ගොෆ්මාන්ගේ නාට්‍යමය න්‍යාය, එමිල් ඩුකයිම්ගේ න්‍යාය ආදී වශයෙන් සමාජානුයෝජනය පිළිබඳ න්‍යායයන් ද රාශියක් ඉදිරිපත්ව ඇත. ඉහත තොරතුරුවලට අනුව සමාජානුයෝජනය ක්‍රියාවලියක් බව වටහාගත හැකිය. එහි පහත ලක්ෂණ දැකිය හැකිය.

- ගතික ක්‍රියාවලියක් වීම
- සංකීර්ණ ක්‍රියාවලියක් වීම
- අඛණ්ඩ ක්‍රියාවලියක් වීම ආදියයි.

සමාජානුයෝජනය යනු සමාජයට එක්වන නවක සාමාජිකයන් එම සංස්කෘතියට අනුව හැඩගැස්වීමයි. සමාජ අනුයෝජනය යන වචන ඒකාබද්ධ වීමෙන් සමාජානුයෝජනය යන වචනය බිහිවී ඇත. මේ අනුව සමාජයට අනුගතවීම සමාජයට අනුව සකස්වීම සමාජයට අනුව හැඩගැසීම අනුකූල වීම සමාජානුයෝජනය ලෙස අර්ථ දැක්විය හැකිය. ඕනෑම සමාජයක සාමාජිකත්වය ලබාගැනීමට එම සමාජයට අනුව හැඩගැසීමට එනම් සමාජානුයෝජනය වීමට සෑම නවක සමාජිකයෙකුටම සිදුවේ.

සමාජානුයෝජනය එහි පුළුල් වූ අර්ථයෙන් ගත් කළ සමාජානුයෝජනය යනු පුද්ගලයන් සමාජයේ සාමාජිකත්වය ලැබීම හෝ සමාජයේ යම්කිසි කණ්ඩායමක සාමාජිකත්වය ලැබීමේ ක්‍රියාවලියයි. පුද්ගලයන් අවට සංස්කෘතියේ හෝ උප සංස්කෘතියේ

අගයයන්, සිරිත් විරිත් පර්යාලෝක පිළිගන්නේ කෙසේද හෝ පිළිනොගන්නේ කෙසේද? යන්න පිළිබඳව සම්බන්ධ වී ඇත. ස්ටර්මන්, (1998)

පුද්ගලයෙකු ප්‍රජාවේ හා සමාජයේ වගකිව යුතු කොටස්කරුවෙකු බවට පත් කරන ක්‍රියාවලියයි. කීන්ස්, (2005).

පරිසරයට පුරුදු වූ පුද්ගලයා එම සමාජයේ සමාජ වාතාවරණයට අනුකූල ලෙස හැඩ ගැස්වීම සමාජානුයෝජනයයි. එමිල් ඩුර්කයිම්, (1858-1917)

සමාජානුයෝජනය යනු පිළිසරණක් නොමැති දරුවා ඔහු හෝ ඇය ඉපදුණු සංස්කෘතියේ පිළිවෙත් පිළිබඳ කුසලතා ලැබ ස්ව සම්ප්‍රජානන හා දැනුම ඇති පුද්ගලයෙකු බවට පත්වන ක්‍රියාවලියයි ගිඩ්න්ස්, (1965)

සමාජයේ පිළිගත් සාමාජිකයෙකු වීම සඳහා කළ යුතු හා නො කළ යුතු දේත් දැන ගත යුතු දේ ඉගෙන ගැනීම සමාජානුයෝජනයයි. (හැවිග් හර්ස්ට් හා නිවුගාර්ටන්)

- කළයුතු දේ ගැන දැන ගැනීම
- නොකළ යුතු දේ ගැන දැන ගැනීම
- දැනගත යුතු දේ පිළිබඳ ඉගෙනීම
- සමාජයේ පිළිගත් සාමාජිකයෙකු වීම පිළිබඳ දැනගැනීම

(සේනාධීර සහ හේවාපතිරණ, 2010).

**සමාජානුයෝජන ප්‍රභේද**

ප්‍රාථමික සමාජානුයෝජනය :- පුද්ගලයා ප්‍රථම වරට තමා අවට පරිසරය හා සමාජය පිළිබඳ ඉගෙන ගන්නේ ප්‍රාථමික සමාජානුයෝජනය මගිනි. මූලික අවශ්‍යතා ඉටු කරමින් කුඩා දරුවකුට තමා අවට ලෝකය ගැන මුලින්ම දැනුම සංජානනය කරනු ලබන්නේ පවුල මගිනි. එය ප්‍රාථමික සමාජානුයෝජනයයි.

ද්විතීයික සමාජානුයෝජනය :- දෙවනුව ලිංගික අධ්‍යාපනය වැනි දේ පිළිබඳ බොහෝ දුරට ළමයා සමාජානුයෝජනය වන්නේ ද්විතියික ආයතන මගිනි. එනම් පෙර පාසල, පාසල, සමවයස් කණ්ඩයම් මගිනි. ඒ හැරුණු විට ක්‍රීඩා සමාජ, තරුණ සංගම්, වෘත්තීය සමිති ආදියද ද්විතියික සමාජානුයෝජන ආයතන ලෙස දැක්විය හැකිය.

තෘතීයික සමාජානුයෝජනය :- රූපවාහිනිය, පුවත්පත්, සඟරා, පොත්පත් ආදීය මගින් පුද්ගලයා සමාජානුයෝජනය කිරීම තෘතියික සමාජානුයෝජනයයි.

පුනර් සමාජානුයෝජනය :- ආගන්තුක, නවක සමාජයකට පිවිසෙන පුද්ගලයා ඊට අනුව හැඩ ගැසීම පුනර් සමාජානුයෝජනයයි. නිදසුන් ලෙස පැවිදි වීම, බන්ධනාගාරගත වීම, විශ්වවිද්‍යාලයකට යාම ආදීය දැක්විය හැකිය.

අපේක්ෂිත සමාජානුයෝජනය :- පුද්ගලයාට අනාගතයේ නියැළීමට සිදුවන නියමිත තත්ත්වයන්ට අදාළ කාර්යභාරයන් පිළිබඳ කලින් ඉගෙනීම (පුහුණුව) අපේක්ෂිත සමාජානුයෝජනයයි. නිදසුන්- සෙල්ලම් වෙල් දැමීම, සෙල්ලමට ගුරුවරියක් වීම, සෙල්ලම් කඩයක් දැමීම

සාවද්‍ය සමාජානුයෝජනය :- තත්ත්වයට අදාළ භූමිකාව වැරදි ලෙස වැඩිහිටියන්ට තුළට අභ්‍යන්තරීකරණය කරනු ලැබීම තුළින් සාවද්‍ය සමාජානුයෝජනය ඇති වේ. උදා- විශ්වවිද්‍යාල ගුරු සිසු මතවාද, ආණ්ඩුව හා ජනතාව අතර පවත්නා අර්බුද, වශයෙනි.

**පවුල නම් සමාජානුයෝගී කාරකයේ කාර්යභාරය**

''දෙමාපියන් පිළිගත් ධර්මතාවන්, අගනාකම්, ආකල්ප දරුවන් විසින් මනෝගමනය කරගෙන යහපත් සුපහන් සිතක් සකස් කරගැනීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනයයි''. (George Herbert Mead) ජයසේන, (2010).

ඉහත සමාජානුයෝජන කාරක පිළිබඳ සැකෙවින් සාකච්ඡා කළෙමු. ඒ අතුරින් ප්‍රාථමික සමාජානුයෝජනය පුද්ගල සංවර්ධනයට

අවශ්‍ය මූලිකම සාධකයක් වේ. ප්‍රාථමික සමාජානුයෝජනය සිදුවන්නේ දෙමාපියන්, සහෝදර සහෝදරියන් ආදීන් හරහා පවුල තුළිනි. පවුල් සංස්ථාව සමාජයේ පවතින්නේ එහි ව්‍යුහාත්මක ස්වරූපය මත නොව, එයින් සමාජයට ඉටුකරන කාර්යභාරය එසේත් නැතිනම් සේවය මතය. ඊට අනුව පවුලේ ව්‍යුහය යනු පවුලෙන් අපේක්‍ෂා කරන කාර්යභාරය ඉටු කිරීම සඳහා ඒ ඒ සමාජයට අනුව පවුල හැඩගැසී ඇති ආකාරයයි. විලියම් ජේ. ගුඩ් මහතා පවුලේ කාර්යභාරයන් ලෙස දක්වන්නේ,

- දරුවන් බිහි කිරීම
- සමාජ අනන්‍යතාවයන් පැවරීම
- සමාජානුයෝජනය
- සමාජ පාලනය
- පෞරුෂ වර්ධනය ආදියයි. (අතුකෝරළ, 1982).

මෙම බෙදීම් විමසා බලන විට පවුලට අයත් ප්‍රධාන කාර්යයයන් 04ක් හඳුනාගත හැකිය.

- ජීව විද්‍යාත්මක කාර්යය
- ආර්ථික කාර්යය
- සංස්කෘතික කාර්යය
- මනෝවිද්‍යාත්මක කාර්යය වශයෙනි.

පවුල් සංස්ථාව කෙරෙහි විවිධ විවිධ විවේචන එල්ල වුවත් ළමයෙකු යහපත් ලෙස ඇති දැඩි කිරීමට ඉතාම යෝග්‍ය ඒකකය පවුල් සංස්ථාව බව හඳුනාගත හැකිය. එම නිසාම නීත්‍යානුකූල විවාහය කෙරෙහි තවමත් විශ්වාසයක් පවතින අතර මේ නීත්‍යානුකූල විවාහයෙන් පසු එකතුවන දෙදෙනාගෙන් සමාජය මූලිකවම අපේක්ෂා කරනුයේ සමාජ දිගටම පවත්වාගෙන යාම සඳහා සාමාජිකයන් බිහි කිරීම හා නිසි ලෙස සමාජයට අනුගත කිරීමයි. එහෙයින් පවුලට

විශාල කාර්යභාරයක් පැවරී ඇත. පවුලෙන් සිදුවන කාර්යභාරය පිළිබඳව මස්ග්‍රේව්, (1979) සඳහන් කරන ආකාරයට පවුල පළමුව ලිංගික අවශ්‍යතාත් දෙවනුව ආර්ථික ඒකකයක් වශයෙනුත් තෙවනුව බාල හා වැඩිහිටියන් රැකබලා ගැනීමත් යන ප්‍රධාන කාර්යයන් ඉටු කරන බවයි. සමාජය තුළ පවුලේ ප්‍රධාන භූමිකාව වනුයේ ළමයාට සුමිතුරු කම, ආදරය, ආරක්ෂාව පුද්ගලයන් අන්තර්ක්‍රියාකරණය ආදිය වර්ධනය කිරීම නව පුද්ගලයාගේ පෞරුෂ සංවර්ධනය කිරීමත් ය.

කාර්ය බහුලත්වය නිසා වර්තමානයේ පවුලින් ඉටුවිය යුතු කාර්යයන් වෙනත් ආයතන මගින් ඉටුවන හෙයින් පවුලේ ඇති වටිනාකම ක්ෂය වෙමින් පවති. මේ නිසා ස්පිටො වැනි අයගේ අදහස වන්නේ පවුල නැමැති ඒකකය සමාජයේ පැවතීම අනවශ්‍ය බවයි. එයට හේතුව නම් පවුලින් ඉටුවිය යුතු කාර්යයන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල්, මූලික පාසල් ආදීයෙන් ඉටුවන බැවිනි. නමුත් අප සිහිතබා ගතයුතු කරුණ නම් එම මූලික සමාජානුයෝජන කාර්යය පවුල මෙන් එම ආයතනවලින් නිසියාකාරවම ඉටු නොවන බවයි.

**ප්‍රධාන පවුල් වර්ග**

- විස්තෘත පවුල
- න්‍යෂ්ටික පවුලක්

න්‍යෂ්ටික, විස්තෘත ආදි වශයෙන් පවුල් වර්ග දෙකකි. ප්‍රාථමික සමාජානුයෝජනයේ වැදගත්ම ඒකකය ලෙස පවුල හඳුන්වා දිය හැකිය. මව් කුසින් ජනිත වන බිළිඳු මුලින්ම සිය මව සමඟ සබඳතාවන් පවත්වයි. ඉනික්බිති පියා, සහෝදර සහෝදරියන්, ඥාතීන් සමඟද සබඳතා පවත්වයි. ප්‍රාථමික සමාජානුයොජනයේදී මව ඉතාමත් වැදගත් සාධකයක් වේ. උපදින විට දරුවා කිසිත් නොදන්නා තැනැත්තෙකි. අන් අයගේ දැඩි රැකවරණය ආරක්ෂාව ඔහුට අවශ්‍ය වේ. මවගේ දෙතනින් කිරි බීම, අත පය වැනීම, සිනාසීම, පෙනෙන රූප දෙස බැලීම, ඇසෙන ශබ්දවලට අවධානය යොමු කිරීම ළදරු අවධියේ ළමයාගේ බුද්ධි වර්ධනයට වැදගත් සේවයක් ඉටු කරයි. පුද්ගලයාගේ ගති ගුණ, ආහාර, පුරුදු, ජීවන දර්ශනය, ලිංගික හැසිරීම්, ලතාව හා

මෝස්තර, ගැහැනු හා පිරිමි පිළිබඳ සංකල්ප ආදි බොහෝ කරුණු උරුම වන්නේ පවුල මගිනි. මෙම අත්දැකීම් දරුවා මුල් අදියරේ දී සමාජානුයෝජනයට උපකාරී වන බව දාරක මනෝවිද්‍යාඥයන් පැහැදිලි කරයි. සිග්මන් 'ෆ්‍රොයිඩ්' පුද්ගලයාගේ පෞරුෂ වර්ධනයට බිළිඳු හා ළමා වියේදී ලබන අත්දැකීම් ප්‍රධාන වන බව පවසයි. මව් සෙනෙහස නොලැබීයාමෙන් දරුවා තුළ ස්නේහයෙන් තොර පෞරුෂත්ව වර්ධනය විය හැකි බව ''ජෝන් බොල්බී'' නම් ළදරු මනෝවිද්‍යාඥයා ප්‍රකාශ කරයි. පවුල වෙතින් ලබන සමාජ උගැන්ම, පවුලේ හිතවතුන්, සොයුරු සොයුරියන්, මව්පියන්, මිත්තනිවරුන් හරහා ළදරුවා අභ්‍යන්තරීකරණය කර ගන්නා බවත්, මෙසේ පුද්ගලයා අයත් සමූහය විසින් අනුදත් හැසිරීම් රටාව, ඉගෙනීමේ අනුවර්ථනමය ක්‍රියාවලිය සමාජානුයෝජනය බව N.M.Nimcoff නම් විද්‍යාඥයාගේ අදහසයි. සමාජයක පවතින සංස්කෘතිය නැතහොත් ඇගයීම් සමුදාය අභ්‍යන්තරීකරණය දෙයාකාරව සිදුවන බව Talcott Parsons හා R.W.Bales යන විද්‍යාඥයන් විසින් කරුණු දක්වයි. එනම් ශක්‍යතා රෝපණ උපක්‍රමයයි. (Cathesti) ස්ථම්භනය (ත්‍යාග දීම) හා මූලෝත්පාදනය (දඬුවම් දීම) (Rainforcement and Extinction) යන කරුණු මතයි. ආදරය හා ගෞරවය නිසා අන්‍යයන් අනුකරණය කිරීමෙන් අවබෝධය ඇති වේ. මෙම උගැන්ම හා ශික්ෂණය Gellen සහ Bowerman යන දෙදෙනා ද මෙසේ සාරාංශ කර දක්වයි.

- දාරක ශරීර වතාවත් විධිමත්ව හුරු පුරුදු කිරීම
- පරිසරය තේරුම් ගැනීමේ ලා ඉවහල් වන සමාජ ආකල්ප ඇති කිරීම
- ජනසන්නිවේදන මාධ්‍යන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට හුරු කිරීම
- වැඩිහිටි දාරක පරතරයෙහි විෂමතා අකාමකා දමා ඒ වෙනුවට ආරක්ෂාව පිළිබඳ හැඟීම දරුවා තුළ ඇති කිරීම ආදියයි.

'මාස්ලෝ' නම් මනෝ විද්‍යාඥයා පවුල මූලික කරගෙන දරුවකුගේ පෞරුෂ සංවර්ධනයට අදාළ වන පූර්ව හේතු කිහිපයක් දක්වයි.

- කායික අවශ්‍යතා (Physiological Needs)
- ආරක්‍ෂක අවශ්‍යතා (Safety Needs)
- සාමාජිකත්වය හා ආදරය (Belongingness and Loye)
- සම්මානික අවශ්‍යතා (Esteem Needs)
- ආත්ම සාක්‍ෂාත්කරණ අවශ්‍යතා (Self Acualization Needs) ආදියයි.

සමාජානුයෝජනය වන දරුවාගේ පැවැත්ම පිණිස පවුලේ ප්‍රධානියකු ද සිටිය යුතුය. බොහෝ විට එය පියාද පියා නැති විට මව විසින්ද දරයි. පවුලේ සාමාජිකයන් අතර ආදරය, කරුණාව, දයාව ආදිය සමානාත්මතාවෙන් යුතුව පැවතිය යුතුය. දෙමාපිය දූදරු බැඳීම අන්‍යෝන්‍ය වශයෙන් භාවාත්මක විය යුතුය. එවිට පවුල තුළ සතුට ඇති වේ. එකිනෙකා තුළ සුහදත්වය අන්‍යෝන්‍ය ගරුත්වය, සුහදත්වය තිබෙන විට සාමකාමී පවුල් පරිසරයක් ද නිර්මාණය වේ. එවැනි පරිසරයක හැදෙන වැඩෙන යහපත් දරුවෙක් තම මව්පියන්ට මෙන්ම සමාජයේ අන්‍ය මිනිසුන් සමඟද සුහදව කටයුතු කරයි. විවාහ ජීවිතය ගත් විට ගැහැනු දරුවන් පියාට සමීපව හැදුණු වැඩුණු නිසා ස්වාමියාගේ නායකත්වය අගය කරයි. පිරිමියා ද කාන්තාව කෙරෙහි එසේම පවති. එවිට පවුල් ජීවිතය ද ගැටුම් රහිත වේ. මානසික තත්ත්වයත් චරිත ස්වභාවයත් යහපත් වේ. බිඳුණු පවුල තුළ සමාජානුයෝජනයක් සිදු නොවේ. පවුලින් ලබන සමාජානුයෝජනය අයහපත් එකක් වූවහොත් ඉන් ලැබෙනුයේ ඉහත දැක් වූ ප්‍රතිඵලයේ ප්‍රතිවිරුද්ධ පැතිකඩයි.

මෙම කරුණුවලින් අනාවරණය කරන්නට යෙදුණේ පවුල නැමති සමාජ කාරකය සමාජ සබඳතා සහිත දරුවකු බිහි කිරීමට ක්‍රියා කරන ආකාරයයි. එක් පරපුරක් බාල පරම්පරාව රැක බලා ගැනීම සඳහා ඔවුනගේ සමාජ ජීවිතය සකස් කිරීමෙහි ලා බෙහෙවින් දායක වේ. වර්තමාන සමාජයේ පවුල බිඳ වැටීම ආශ්‍රිතව වර්ධනය වන ලිංගික අපචාර, ළමා අපචාර, දරුවන් අනාථ වීම, දික්කසාද වීම් ආදිය පිළිබඳ අවධානය යොමු කරන විට සමාජානුයෝජන කාර්යයෙහිලා

පවුලින් ඉටුවන සේවයෙහි පරිමාව පිළිබඳ අපට අවබෝධයක් ලද හැකිය.

**සමවයස් කණ්ඩායම් හා සමාජානුයෝජනය**

පවුලෙන් පසු ළමයාගේ සමාජානුයෝජනය කෙරෙහි බලපාන ප්‍රධාන කාරකය වශයෙන් සම වයස් කණ්ඩායම හැඳින්විය හැකිය. ළමයා ඇති දැඩි වන්නේ සමාජ ලෝක දෙකකය. ඉන් එකක් ළමයාගේ දෙමව්පියන්, නෑදෑයන්, ගුරුවරුන්, වැඩිහිටියන්ගෙන් සමන්විත වන අතර අනික බොහෝවිට ළමයාගේ සම වයසේ සිටින මිත්‍රයන්ගෙන් හෝ කුඩා කණ්ඩායම් සාමාජිකයන්ගෙන් හෝ පාසලේ පන්ති කාමර සාමාජික වැන්නවුන් ගෙන් සමන්විත වේ. සම වයස යනුවෙන් අදහස් කරනුයේ සමානතාවක් හෙයින් එය සමානතා ඇති කණ්ඩායමක් වශයෙන් හැඳින්වීම නිවැරදිය. ළමයින් පළමුවෙන්ම අයත් වන සමවයස් කණ්ඩායම බොහෝවිට දෙමවුපියන් විසින් ඉතා සුපරික්ෂාකාරීව තෝරාගන්නා එකක් විය හැකි වුවත් ළමයා ක්‍රමයෙන් වැඩෙත්ම දෙමව්පියන්ට මෙම පිළිවෙත තවදුරටත් ක්‍රියාත්මක කිරීම අසීරු වේ. දෙමවුපියන්ගේ පරිසරයෙන් ඉවත්වී පාසල් ජීවිතය අරඹන ළමයාගේ ඇසුරට පත්වන සෙසු ළමයි කවුද යන්න තීරණය කිරීමට දෙමව්පියන්ට ඇති ඉඩප්‍රස්ථා සීමිත වන්නේ පාසලකට විවිධ පරිසරවලින් පැමිණෙන ළමයින් රාශියක් ඇති හෙයිනි. මෙයින් පැහැදිලි වන්නේ ළමයාගේ ඇසුරට පත්වන සමවයස් පිරිස කවරහු විය යුත්තේ ද යන්න පිළිබඳව තීරණය ගැනීමට දෙමව්පියන්ට ඉඩප්‍රස්ථාව නොමැති බවය. ඉතා කුඩා කල සිට ම පුළුල් සමාජ ලෝකයක් ළමයාට විවෘත වන නවීන යුගයේ දී විවිධ සමවයස් කණ්ඩායම්වල බලපෑමට ළමයා යටත්වීම වැලැක්වීම ඉතා දුෂ්කර කාර්යයකි.

සමවයස් කණ්ඩායම සමාජයට මෙන්ම සමවයස් කණ්ඩායමේ සාමාජිකයින්ට ද වැදගත් මෙහෙයක් ඉටු කරයි. මේ ඇයුරින් සමවයස් කණ්ඩායම ළමයාගේ ජීවිතයට අවශ්‍ය අංගයක් බවට පත් වීමට ප්‍රධාන වශයෙන්ම බලපා ඇත්තේ වර්තමාන සමාජ රටාව බව සඳහන් කළ හැකිය. සංවර්ධිත රටවල පවතින සංස්කෘතික හා සාමාජීය පසුබිම විශේෂයෙන් පවුලේ බලපෑම හීන වීම සමවයස් කණ්ඩායමේ

ප්‍රබලත්වය වැඩි කිරීමට බෙහෙවින් බලපා ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල මෙම තත්වය තරමක් වෙනස් වුවත් වෙනත් සාධකවල බලපෑම හේතුකොටගෙන සමවයස් කණ්ඩායම බලවත් වී ඇත. එක අතකින් අනවශ්‍ය ලෙස ශාස්ත්‍රීය විශිෂ්ටත්වය ලබා ගැනීම සඳහා තෙරපීමකට භාජනය වන ළමයා එම තෙරපීමෙන් මිදීමට බොහෝවිට සමවයස් කණ්ඩායමේ සහාය පතයි. පීඩනයෙන් යුතුව ප්‍රබල ලෙස හික්මීමට හා පාලනයට පාත්‍රවන පන්ති කාමර වාතාවරණයෙන් මිදී ළමයාට වඩා හිතකාමී පරිසරයක් ගොඩනගා ගැනීමට සමවයස් කණ්ඩායම් පිහිටවෙන බව සෝකච්, (2006) පෙන්වා දී ඇත. සමවයස් කණ්ඩායම් එකම වයස් කාණ්ඩයකට අයිති පිරිස් එකතුවක් නිසා සාමාන්‍ය පවුල් රටාවක් තුළ ලැබිය නොහැකි අත්දැකීම් සමුදායක් ලබා ගැනීමට ළමයාට අවස්ථාව ලැබේ. වර්තමානය විස්තෘත පවුල් රටාවට වඩා න්‍යෂ්ටික පවුල් රටාව ජනප්‍රිය වීම මෙම තත්ත්වය උදා කිරීමට බෙහෙවින්ම ආධාර කර ඇත. සම වයසේ අය සමග හැසිරීමෙන් ලබන අත්දැකීම් වැඩිහිටි ජීවිතයට ලබන සූදානමකි. පසු කාලීන වැඩ ලෝකයට ප්‍රවිශ්ඨ වීමත් සමග පුද්ගලයාට වැඩි කාලයක් බොහෝ විට ගත කිරීමටත් වැඩි යෙදීමටත් සිදුවනුයේ සමකාලීනයන් සමඟ ය. මස්ග්‍රේව්, (1978) දක්වන පරිදි ගැටවර වියේදී සමවයස් අය සමඟ මිශ්‍ර වීමට අවශ්‍ය සමාජ කුසලතා ඉගෙන නොගන්නා ගැටවරයා වැඩිහිටියෙකු වශයෙන් විධිමත් ජීවිතයක් ගත කිරීමට ඇති අවස්ථාව ඉතා සීමිතය.

## ජනමාධ්‍ය හා සමජානුයෝජනය

සමාජානුයෝජනය යනු යම්කිසි පුද්ගලයකුගේ සංස්කෘතිය, අගයන්, විශ්වාස හා ප්‍රතිමාන ඉගෙනීම හා අභ්‍යන්තරීකරණය මගින් පුළුල් සමාජ ලෝකය සමග සම්බන්ධ වීම හා තමාගේ ආත්මීයභාවය පිළිබඳව හැඟීමක් ඇති කර ගැනීමේ ක්‍රියාවලියකි. අපගේ ජීවිත කාලය තුළ රංගනය කිරීමට සිදු වී ඇති විවිධ භූමිකා හා ඒවායේ සමාජ සම්මතයන්ට අනුකූල වන ආකාරයට ක්‍රියාත්මක කළ යුතු අන්දම පිළිබඳව අවබෝධයක් ලබා ගනී. අපේ සමාජය තුළ පවුල, පාසල වැනි සමාජ ආයතනවලට ළමයා සමාජයට හුරු කිරීමේ දී නියමිත භූමිකාව පිළිබඳ නිශ්චිත පැහැදිලි රටාවක් තිබුණ ද සමවයස් කණ්ඩායම් වැනි සමාජානුයෝජන කාරකයන්ට එවැනි නිශ්චිත වගකීමක් නොමැති

වුවත් ප්‍රබල භූමිකාවක් රංගනය කිරීමට සිදුවන බව පැහැදිලිය. ජනමාධ්‍ය ද සමවයස් කණ්ඩායම් සේම සමාජානුයෝජන ක්‍රියාවලියේදී පැවරී ඇති නිශ්චිත භූමිකාවක් නොමැති වුවත් තත්කාලීන සමාජය තුළ ප්‍රබල කාර්යභාරයක් ඉටු කරමින් සැලකිය යුතු බලපෑමක් ළමා ජීවිත කෙරෙහි එල්ල කරන බව හඳුනාගත හැකිය.

මාධ්‍යයන්ගේ බලපෑම් හේතුකොටගෙන ළමයින්ගේ චර්යා විවිධ අයුරින් වෙනස්වීමට ඉඩ ඇති බව පර්යේෂණ වලින් සොයාගෙන ඇත. 1958 දී අවුරුදු 10 - 14 අතර ළමයන් යොදාගෙන කරන ලද පර්යේෂණයක් ආශ්‍රයෙන් හිමවෙල්ට් සහ සගයන් සඳහන් කරනුයේ නිතර නිතර වෙඩි තබා ගන්නා කව්බෝයි වැනි චිත්‍රපට නරඹන ළමයින් එවැනි දර්ශන සහාසික ඒවා ලෙස වර්ග නොකරන බවයි. මෙයින් පෙනී යන්නේ සහාසික දර්ශන අඩංගු චිත්‍රපට නැරඹීම නිසා සාහසික ක්‍රියා ජීවිතයේ කොටසක් වශයෙන් ග්‍රහණය කර ගැනීමට මෙම ළමයින් හුරු වූ බවයි. මෙය ලංකාවට ද අදාළ වේ. දරුණු සාහසික ක්‍රියා ශ්‍රී ලංකාවේ වාර්තා වූයේ කලාතුරකින් වුවත් වර්තමානයේ මිනීමැරුම්, මං පැහැරීම් වැනි දරුණු ක්‍රියා නිරන්තරයෙන් වාර්තා වීම හේතුකොටගෙන වැඩිහිටියන්ගේ හා ළමයින් ඒ මගින් දැඩි කම්පනයකට භාජනය වීමක් දක්නට නොලැබෙන අතර ජීවිතයේ සාමාන්‍ය සංසිද්ධියක් වශයෙන් ග්‍රහණය කරගැනීමට විශේෂයෙන්ම බාල පරපුර සමත් වී ඇතැයි කීම නිවැරදිය. එම නිසා ඔවුන් කම්පනයට හා පීඩනයට මුහුණ දීමට ලබන හැකියාව මෙම බාල පරපුරේ සමාජානුයෝජනයට බෙහෙවින්ම බලපෑම් කරනු ලැබේ. එමෙන්ම මාධ්‍යවල බලපෑම හේතු කරගෙන යථාර්ථය පිළිබඳ අවබෝධයක් ලැබීම නිසා ද පීඩනය හා කාන්සාව මර්දනය කර ගැනීමට ළමයින් හුරුවීම ඔවුන්ගේ පෞරුෂ සැකසීමේදී බලපෑම් කරන බව මස්ග්‍රේව්, (1976) සඳහන් කරයි. ජයසේන, (1982).

**පාසල හා සමජානුයෝජනය**

දැනුම, රැකියා, කුසලතා, සංස්කෘතික ප්‍රතිමාන සහ අගයන් සම්ප්‍රේෂණය කිරීම සඳහා මඟ පෙන්වන සමාජ ආයතනයේ වූයේ අධ්‍යාපනයයි. සංස්කෘතික උරුමය රැකගැනීම අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වන අතර නොදියුණු සමාජවල මෙය බොහෝ දුරට

ක්‍රියාත්මක කරනු ලැබුවේ අවිධිමත් සමාජ ආයතන මගිනි. ඉපැරණි ලෝකය සතු තාක්ෂණය වර්තමානයේ ඇති වූ තාක්ෂණික සංවර්ධනය හා විස්තෘත පවුල් රටාව දුර්වල වීමෙන් වටිනාකම අඩුවීම නිසා බාලයන් වැඩිහිටියන් බවට පත් කරන බලවේග හීන වූ අතර මේ ක්‍රියාදාමය සඳහා සමාජයට නවීන සන්ධාන සෙවීමට සිදුවිය. මේ සඳහා යොදා ගත් එක් උපකරණයක් වූයේ විධිමත් අධ්‍යාපනයයි. වර්තමානයේ නවීනව ගොඩනගන ලද පාසල මගින් කරනුයේ ද මෙම කාර්ය භාරයයි. ඕනෑම සමාජයක සංස්කෘතිය ක්‍රමයෙන් සංචිත වන අතර එය කාලීනව සකස් කරමින් විධිමත්ව බාල පරපුරට පවරා දීම නවීන පාසල සතු ප්‍රබල කාර්යභාරය ලෙස සලකනු ලැබේ. මෙසේ සංස්කෘතිය සංචිත වීමත් එය බාල පරපුරට සම්ප්‍රේෂණය කිරීමත් මගින් පාසල කරනුයේ එක්තරා අන්දමක සමාජානුයෝජන ක්‍රියාවලියකි.

**ආගමික සමාජානුයෝගී දෘෂ්ටි කෝණය**

''පුද්ගලයා සමාජයට හුරු කරවමින් මේ ලෝකය පිළිබඳ යම් දැනුමක් ලබාදීම (ඉමස්ස ලෝකස්ස දස්සෙතාරා) සමාජානුයෝජනය බව බුදුරජාණන් වහන්සේගේ දේශනාවයි. ජාතිය, ආගම, කුලය ආදි පුද්ගල අනන්‍යතාවන් සමාජය වෙතින් පුද්ගල සන්තානය තුළ ආරෝපණය කිරීම සාමාන්‍ය ස්වභාවයකි. එමෙන්ම ආහාර, ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත් ආදිය හුරු කරවීම ද සමාජයේම එක් ක්‍රියාවලියකි. මෙසේ පුද්ගලයා සමාජයට ගැළපෙන මිනිසකු ලෙස සකස් කරනුයේ සමාජානුයෝජන ක්‍රියාවලියෙනි. පළමුව පවුල කේන්ද්‍ර කොටගෙන සමාජගත වන පුද්ගලයා ඉන් අනතුරුව ආගම, අධ්‍යාපනය, වෘත්තිය මගින් ද්විතීයික සමාජානුයෝජනය ලබාගනී.

විශේෂයෙන්ම බුදු දහම පුද්ගලයා ඇගයීමට ලක් කරනුයේ තනි තනි පුද්ගලයා වශයෙන් ගෙන නොවේ. සමස්තයම එක් අංශුවක් ලෙස ගෙනය. මේ අනුව අපට අවබෝධ වන්නේ ඔහු බාහිර පරිසරයෙන් තොර හුදෙකලා පුද්ගලයකු නොවන බවයි. බුදු දහම පෙන්වන උපරිම තත්වය ලත් තැනැත්තාගේ ස්වභාවය නම් සමස්තයටම ගැළපෙන පරිදි නිවැරදිව තේරුම් ගැනීමයි. මේ අනුව බොහෝ බෞද්ධ ඉගැන්වීම් සමාජානුයෝජන සංකල්පය පදනම්

කරගත්තක් බව පැහැදිලිය. දිසා නමස්කාරය, සීලය, සතර සංග්‍රහ වස්තු, දස පාරමිතා, දස රාජධර්ම, සප්ත අපරිහානීය ධර්ම, ආදි බෞද්ධ සංකල්පයන් සාමාජානුයෝජනය අපේක්ෂාවෙන් ඉදිරිපත්ව තිබේ. ''කිසියම් දරුවකු සමාජයට යහපත් ආකාරයෙන් දායාද කරවීමේ පළමු වගකීම පැවරෙන්නේ දෙමාපියන්හට'' බව දිසා නමස්කාර සංකල්පය මගින් ප්‍රකට කරයි. මේ අනුව පැහැදිලි වන්නේ සමාජනුයෝජන ක්‍රියාවලිය මැනවින් සංගෘහිතව ඇති බවකි.

- වරදින් දරුවා වැළැක්වීම (පාපා නිවාරෙන්ති)
- යහපතෙහි දරුවා යෙදවීම (කල්‍යාණෙ නිවෙසෙන්ති)
- ශිල්පයන්හි යෙදවීම (සිප්පං සික්ඛාපෙන්ති) හෙට්ටිආරච්චි, (2001).

ඉහත සඳහන් දෑ මෙහිලා ඉතා වැදගත්ය. මේ අනුව සදාචාරත්මක, ආගමික, සංස්කෘතික ආදි කටයුතු එතුළින් අපේක්ෂිත බව ගම්‍ය වේ. එමෙන්ම ආර්ථික හා සාමාජීය තත්වයන් කෙරෙහිද අවධානය යොමු කොට තිබේ. මුදල් හිමිකර දීම, යම් වෘත්තියක් පුහුණුකරවීමත්, අනාගතයේදී දරුවාගේ ආර්ථික තත්වයට යම් බලපෑමක් සිදු කරයි. පැවැත්ම සඳහා විවාහ සබඳතා ඇතිකරවිමට ද සැලසුම් කරයි. මේ ආකාරයට සමාජ ගතවන දරුවා ස්වකීය ජීවන චර්යාවන්වලට මුහුණ දෙමින් ද්විතියීක සමාජානුයෝජන ක්‍රියාවලියෙහි එක් පුරුකක් බවට පත්වෙයි. දිසානමස්කාරය හරහා ප්‍රාථමික සමාජානුයෝජනය මෙන්ම ද්විතීයික සමාජානුයෝජනය ද විමසිය හැකිය. අධ්‍යාපනය, ආගම, රැකියාව හා මිත්‍රත්වය ආදි සමාජ ස්ථර ද්විතීයික සමාජානුයෝජනයට අනුකූල වූ ආයතනයන්ය. මෙහි දී මිත්‍රත්වය පිළිබඳ යම් අදහසක් පළමුව ඇතිකර ගැනීම වැදගත්වේ. මිත්‍රත්වය බුදුදහමෙහි විස්තරවන වැදගත් සංකල්පයකි. සිගාලෝවාද සූත්‍රයෙහි උත්තර දිසා නමස්කාරය යනු මිතුරන් සතුටු කිරීමයි. ව්‍යග්ඝපජ්ජ සූත්‍රතයට අනුව ''මිතුරන් සම වයස් තත්වයකට සීමා නොකරයි.'' (නිවසේ දි තම මව මිතුරියකි. තම බිරිද හොදම මිතුරියකි) මේ අනුව ඇසුරට සුදුසු හැමකෙක්ම මිතුරෙකු බව පිළිගත හැකිය. එහෙත් මිතුරන් මෙන් සිටින මිත්‍ර ප්‍රතිරූපකයන් ද අප අතර වෙති. දියුණුවට හේතුවන කරුණු විස්තර වශයෙන් පෙන්වා දෙන

මංගල සූත්‍රයෙහි ද මිතුරන් හා මිත්‍ර ප්‍රතිරූපකයන් ඇසුරු කිරීමේ දි අනුගමනය කළයුතු ක්‍රම ගනණාවක් සඳහන් කරයි.

- බාලයන් බැහැර කිරීම (අසේවනා ච බාලානං)
- නුවණැත්තන් ඇසුරු කිරීම (පණ්ඩිතානං ච සේවනා)
- සුදුසු කල ධර්මය ශ්‍රවණය කිරීම (කාලෙන ධම්ම සවණං)
- එක්රැස්ව සාකච්ඡා කිරීම (කාලෙන ධම්ම සාකච්ඡා)
- කෘතගුණ සැලකීම (කතඤ්ඤුතා) හෙට්ටිආරච්චි, (2001).

මිත්‍රත්වය පුද්ගලයා සමාජයට අනුරූපව හැඩ ගැස්වීමේ කාර්යෙහිලා බුදු දහම කෙතරම් දුරට අගය කෙරේ ද යන්න පැහැදිලිය. බෞද්ධ ඉගැන්වීමට අනුව මෙලොව පමණක් නොව පරලොව ශුභ සිද්ධිය උදෙසා ද මිත්‍රාශ්‍රය ඉතාමත් අගනේය. මිත්‍රාශ්‍රය පුද්ගල සන්දර්භයෙහිලා සමායෝජන ක්‍රියාවලියක් බව මහාචාර්ය රත්නපාල ප්‍රකාශ කරයි. ''කාලය නියම කොට දැක්විය නොහැකි භවගාමී පැවැත්මක් පිළිබඳ සංකල්පය නිසා සමාජානුයෝජනයට බෞද්ධ ඉගැන්වීම්වලින් සාංසාරික සන්දර්භයක් එක්වෙයි. පුද්ගලයාගේ උපත නැවත නැවතත් සිදුවන එක් භවයකින් අනෙකකට සමාජානුයෝජනයේ ප්‍රතිඵල ගෙන යෑමක් සිදුවේ. කෙනෙකුගේ ක්‍රියාඵල කර්ම විපාක වශයෙන් ඊළඟ භවයට ගෙනයයි. මේ අනුව සමාජානුයෝජනය පුද්ගලයාගේ ජීවිතය උපතකින් උපතකට සම්බන්ධ කෙරේ''

සමාජය සතු යුතුකම් හා අයිතිවාසිකම් විග්‍රහ කිරීමේ දි කිසිදු බලපෑමක් මෙහිදී ඇති නොවේ. සේවකයින් තම වැටුප් වැඩිකර ගැනීම අයිතිවාසිකමක් ලෙස සලකා අරගල කිරීමට පෙලඹෙන්නේ ස්වාමියාගේ යුතුකම ලෙස සුදුසු පරිදි වැටුප් නොගෙවන තැනක බව නිදසුනක් ලෙස දැක්විය හැකිය. ධනවාදී අර්ථ ක්‍රමයට වෙනස් වූ තත්වයක් පවතින බෞද්ධ සමාජයේ සමාජානුයෝජන ක්‍රියාවලිය විශේෂත්වයක් ගනී. මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව වර්තමානයෙහි ඇත්තේ දැඩි අවධානයකි. එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙතින් හඳුනාගෙන ඇති එවැනි මූලික අයිතිවාසිකම් රාශියක් පවති. බොහෝ රටවල මෙවැනි දෑ බොහෝමයක් ස්වකීය රටවල නීති පද්ධතියට ද ඇතුළත්

කොට ඇත. මෙසේ සිදුවන සමාජානුයෝජන ක්‍රියාවලිය බුදු දහමෙහි සදහන් වන්නේ ස්වේච්ඡාවෙන් ක්‍රියාවට නැංවෙන ප්‍රතිපත්තියක් ලෙසිනි. ඒ අනුව සෑම බෞද්ධයෙකුම පාහේ පඤ්ච ශීලයෙහි පිහිටයි. එය ඔහුගේ නිත්‍ය ශීලයයි. මෙහි ඇතුළත් අත්තුපනායික ධර්ම පර්යාය ලෙසින් ද පෙළ දහමෙහි විස්තර කෙරේ. ''මම හිංසා පීඩා ලැබීමට අකැමැත්තෙමි. මරනු ලැබීමට අකැමැත්තෙමි. එනිසා කිසිවකු මට හිංසා නොකළ යුතු බව පිළිගනිමි. ඔබ ද අනෙක් මිනිසුන් ද වෙනත් සතුන් ද ස්වකීය ජීවිතවලට කැමතිය. මිය යන්න අකැමැතිය. හිංසා ලැබීමට අකැමැතිය. එනිසා මා ගැන මෙන් ඔබ ගැන ද අන් අය ගැන ද වෙනත් සතුන් ගැන ද සලකා මම හිංසනයෙන් පීඩනයෙන් වැළකෙමි. ඝාතනයෙන් වැළකෙමි.'' සෙසු ශික්ෂා පද සම්බන්ධව ද එසේම ය. ප්‍රසන්න සමාජයකට බුදු දහමේ සමාජානුයෝජනය මෙපරිදිය.

**සමාජානුයෝජන ක්‍රියාවලියේ ලක්‍ෂණ**

සමස්ත සමාජය තුළ පවතින එක් ක්‍රියාවලියක් ලෙස සමාජානුයෝජනය හඳුන්වා දියහැකිය. මෙමගින් සමාජයට හඳුන්වා දෙනු ලබන නවක සාමාජිකයන් ඉතා සාර්ථක ලෙස සමාජය තුළ සංස්ථාපනය කරනු ලබයි. එසේ නොමැති නම් සමාජය තුළ මැනවින් අනුයෝජනය කරයි. මෙසේ අනුයෝජනය වූ පුද්ගලයා සමාජානුයෝජන ක්‍රියාවලිය ඉදිරියට පවත්වා ගෙන යයි. එසේ සිදුවන සමාජානුයෝජන සංකල්පය ප්‍රධාන ලක්‍ෂණ කිහිපයක් ඔස්සේ හඳුනා ගත හැකිය. ඒ මෙසේයි.

1. සමාජ හරයන් අභ්‍යන්තර ගතකිරීම
2. විවිධ සංස්කෘතීන් අනුව හැඩ ගැසීම
3. විවිධ සංස්ථා හා පුද්ගලයින්ට සම්බන්ධවීම
4. විවිධ සමාජානුයෝගී ශිල්පීය ක්‍රම අවස්ථානුකූලව යොදා ගැනීම
5. පුද්ගලයා ජීවිතයේ ගත කරන විවිධ අවධි අනුව සමාජානුයෝජනය වෙනස්වීම

## 01. සමාජ හරයන් අභ්‍යන්තර ගත කිරීම

මෙහි ප්‍රධාන ලක්ෂණයක් ලෙස සමාජ හරයන් අභ්‍යන්තර ගත කිරීම නම් වූ සංකල්පය හඳුනා ගත හැකිය. සමාජය වෙතින් යහපත් යැයි පිළිගත් ඒ අනුව කටයුතු කරන සිරිත් විරිත්, සම්ප්‍රදායන්, ආකල්ප හා ඇගයුම් ආදිය එයට අදාළ කරගනී. සමස්ත සමාජයක් නියෝජනය කරනු ලබන මිනිසා වැඩි පිරිසකගේ සම්මතයට අවනත විය යුතුයි. එසේ නොවුන හොත් එය ඔහුට පමණක් නොව සමස්ත සමාජයටම බලපානු ලබන ප්‍රශ්නයක් බවට පත් විය හැකිය. මිනිසා සමාජයට අවශ්‍ය කරන යහපත් පුද්ගලයෙකු වශයෙන් නිර්මාණය කිරීමට සමාජ හරයන් අභ්‍යන්තර ගත කිරීම ඉතාම වැදගත් වේ. පාසල, පවුල, ආගමික ආයතන ආදී සමාජමය ආයතන තුළින් පුද්ගලයා සමාජය තුළ කෙසේ ජීවත්විය යුතු ද යන්න පිළිබද බොහෝ අවබෝධයන් අපට ලබාදෙයි.

සමාජ හරයන් මගින් පුද්ගලයකු විසින් කළයුතු දෑ හා නොකළයුතු දෑ පිළිබද යම් අභ්‍යන්තරික ශික්ෂණයක් ඇති කරගනි. මේ අනුව කළයුතු දෑ හා නොකළයුතු දෑ පිළිබද යම් යම් සම්මතයන් ද පවති. නිදසුනක් ලෙස වැඩිහිටියන්ට සැලකීමේ කුලසිරිත හඳුනා ගත හැකිය. මෙහි දි වැඩිහිටියන්ගේ අවවාද පිළිගැනිම, දැක හුනසුනෙන් නැගීසිටිම, වැද ආචාර කිරීම, ගෞරව කිරීම ආදි වු අනේකවිධ සිරිත් රාශියක් ඇති බව පෙනේ. මෙම කුලසිරිත පරම්පරා ගණනාවක් ඔස්සේ සමාජය වෙත සම්ප්‍රේෂණය වූයේ සමාජානුයෝජන ක්‍රියාවලියේ එක් ප්‍රතිඵලයක් ලෙසිනි. මේ අනුව සමාජය තුළ විසිරී පවතින බොහෝ චාරිත්‍ර ධර්මයන් පුද්ගලයා හා පරිසරය සමග බද්ධව පවති. විශේෂයෙන්ම මේ සියල්ලක්ම බුදු දහම සමග එක්ව තිබේ. ඒ අනුව දරුවකුගේ උපත, ඉදුල් කටගෑම, අකුරු කියවීම, වැඩිවියට පත්වීම, විවාහය, ආදි හරපද්ධතීන් හැමකක්ම සමාජගතව ඇත්තේ සමාජානුයෝජන ක්‍රියාවලිය හරහාය.

## 02. විවිධ සංස්කෘතීන් අනුව හැඩ ගැසීම

සමාජානුයෝජන ක්‍රියාවලියෙහි වැදගත්කමක් හිමිකර ගනුලබන තවත් එක් සිද්ධාන්තයක් ලෙස විවිධ සංස්කෘතීන්වලට අනුව හැඩ ගැසීම හඳුනා ගතහැකිය. මන්ද යත් පුද්ගලයාගෙන් පුද්ගලයාට,

කුලයෙන් කුලයට, සමාජයෙන් සමාජයට, බොහෝ ආකල්පයන් විවිධ බැවිනි. එමෙන්ම සංස්කෘතියෙන් සංස්කෘතියට ද එය ඒ ආකාරයෙන්ම බලපායි. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, ජාතීන්ගේ සංස්කෘතිය ඒ ඒ ජාතීන්ට අනුව වෙනස් ස්වභාවයක් ගනී. විශේෂයෙන්ම එක් ජාතියකට අයත් වූවන් භාවිත කරනු ලබන භාෂාව හාත්පසින්ම වෙනස් ආකාරයක් පෙන්නුම් කරයි. එමෙන්ම සිරිත් විරිත්, ආහාර, ඇඳුම් පැළඳුම්, ආගම් ආදි සංස්කෘතිකාංගයන් එකිනෙක හා යම් භේදනයක් ඇති බව දක්වයි. සමාජානුයෝජනය විවිධ සංස්කෘතීන් අනුව හැඩ ගැසීම තුළ සංස්කෘතික විවිධතාවන් හඳුනා ගත හැකිය. මෙමගින් ඒ ඒ සමාජ භූමිකා තුළ ඇති අනන්‍යතාවන් මැනවින් ග්‍රහණය කර ගැනීමට අවස්ථාවක් උදාවෙයි. සංස්කෘතිය යන්නෙන් අදහස් කරන්නේ පුද්ගල චර්යා සුදුසු පරිදි යම් ආකාරයකට හැඩගස්සවා ගැනීමයි. සංස්කෘතිය මත පදනම්ව පවතින යහපත් අයහපත් සංකල්ප මැනවින් හඳුනා ගැනීමට අවශ්‍ය වන තත්වයන් ඇති කරගනුයේ සමාජානුයෝජන න්‍යාය පදනම් කොට ගෙනය.

විවිධාකාර වූ සංස්කෘතීන් සමාජය තුළ ක්‍රියාත්මක වන විට හැමකෙක්ම ඊට අවනතව කටයුතු කිරීම හේතු කොටගෙන සමාජ ප්‍රශ්න රැසකට ඉන් යම් සහනයක් ලැබෙයි. ඒ හරහා සාමය, සමගිය, සතුට වැනි ගුණධර්මයන් වර්ධනය කරගැනීමට ද පහසුක් වෙයි. එක් සංස්කෘතියක් විනාශ කරමින් අන්‍ය වූ සංස්කෘතියක් ඉස්මතු වීම පසෙකලා සෑම සංස්කෘතියකම පැවැත්ම තහවුරු කරගැනීම උදෙසා බොහෝ පුද්ගලයන්ගේ දායකත්වය ඉතා වැදගත්ය.

## 03. විවිධ සංස්ථා හා පුද්ගලයින් සම්බන්ධ වීම

මෙහිලා ඉතා වැදගත් සමාජානුයෝජන ක්‍රියාවලියක් ලෙස විවිධ සංස්ථා හා පුද්ගලයන් සම්බන්ධ වීමේ තත්වය හඳුනා ගත හැකිය. විශේෂයෙන්ම සමාජානුයෝජන ක්‍රියාවලියේ දි දෙමාපියන්, ගුරුවරුන්, සහෝදර සහෝදරියන්, ඥාතීන්, භික්ෂූන් වහන්සේලා, හිත මිතුරන් ආදි වශයෙන් දැක්වූ සමාජ නියමුවන් ප්‍රධාන වේ. ඉහත දැක්වූ සමාජ නියමුවන් අතුරින් ප්‍රධාන වූ දෙමාපියන් වෙතින් දරුවන් වෙත සමාජානුයෝජන අවස්ථාවේ සිදුවන මෙහෙවර අපමණය. සෙසු පුද්ගලයන් වෙතින් ඊට සමගාමී වූ මෙහෙවරක්

ඉටුවන බව අමතක නොකළ යුතුයි. මෙහිදී ගුරුවරුන් හා භික්ෂූන් වහන්සේලා සමාජානුයෝජන කාර්යයේදි සුවිශේෂී වැදගත්කමක් ඉටුකරනු ලබයි. දරුවා යහමගට යොමුකරවීමත්, ඔහු සුදුසු වෘත්තියක් වෙත යොමුකරවීමත්, දරුවාට සමාජය ගැන යම් දැනුමක් ලබාදීමත් ගුරුවරුන් වෙතින් සිදු වේ. එසේම දරුවාගේ ආගමික පැවැත්ම, ආචාරශීලීත්වය, දහම් දැනුම, ආකල්පමය හැගීම් ආදි ආකල්පමය වෙනසක් දරුවා වෙත ඇති කරනුයේ භික්ෂූන් වහන්සේය.

සමාජානුයෝජන ක්‍රියාවලියේ ආරම්භය පවුල් සංස්ථාව යැයි අර්ථ දැක්වුවහොත් එය නිවැරදිය. පවුල නැමැති සමාජ සංස්ථාව නියෝජනය කරනු ලබන පිරිස අතර ප්‍රධානත්වය දෙමාපියන්ට හිමි වීම වරදක් ද නොවේ. එයට හේතුව නම් දරුවකු ප්‍රථමයෙන් සමාජය වෙත නිවැරදිව දායාද කරනුයේ ඔවුන් වෙතින් වන නිසාවෙනි. ද්විතියික සමාජානුයෝජන මධ්‍යස්ථානය වන පාසල ද වෙතින් දරුවන්ගේ හැකියාවන්, කුශලතාවන් හා දක්ෂතාවන් ඉස්මතු කොට දක්වයි. එම හැකියාවන් සියල්ලක්ම හඳුනා ගනිමින් ඒවා දරුවන් වෙත ප්‍රගුණ කරවීමට ද කටයුතු කරයි. මෙම ක්‍රියාවලියෙහි නියමුවන් වන්නේ ගුරුවරුන්ය. වෘත්තිමය ජීවිතයේ දි යම් වෘත්තිමය පැවැත්මක් සඳහා අවශ්‍ය වන දැනුම හා පුහුණුව ලබාදෙන්නේ වෘත්තිය මධ්‍යස්ථාන මගිනි. එසේම මේ සඳහා ජනමාධ්‍ය හරහා ද යම් බලපෑමක් සිදු කරයි. මේ අනුව විවිධ සංස්ථාවන් හා පුද්ගලයින් සම්බන්ධ වීම සමාජානුයෝජනයේ දි වැදගත් වන ආකාරය පැහැදිළිය.

### 04. විවිධ සමාජානුයෝගී ශිල්පීය ක්‍රම අවස්ථානුකූලව යොදා ගැනීම

විවිධ සමාජානුයෝගී ශිල්පීය ක්‍රම අවස්ථානුකූලව යොදා ගැනීම නම් වූ සංකල්පමය චින්තනය සමාජානුයෝජන ක්‍රියාවලියෙහි දි වැදගත් ස්ථානයක් හිමි කරගෙන ඇත. මෙහිදි ත්‍යාග ලබාදීම, අවවාද ලබාදීම, අනුශාසනා ලබාදීම ආදිය අගය කෙරේ. යම් දරුවකුගේ යම්බඳු වූ ක්‍රියාවක් අගය කොට ඒ සඳහා ත්‍යාග ලබාදීම තුළින් දරුවා තුළ පවතින හැකියාවන් වර්ධනයට එයම අවස්ථාවක් වෙයි.

සමාජය තුළ ජීවත් වන පුද්ගලයා තමා විසින් කළයුතු හා නොකළයුතු දේ පිළිබඳ යම් අවබෝධයක් ලබා ගනී. මෙමගින් සමාජය තුළ යහපත් පිරිසක් බිහිවීම වැළැක්විය නොහැකිය. එමෙන්ම

අනුශාසනා ලබාදීම තුළින් ද වැදගත්වන සමාජානුයෝජන තත්වයක් අත්කරගෙන තිබේ. මෙහිදි භික්ෂූන් වහන්සේලා, වැඩිහිටියන්, දෙමාපියන් වෙතින් අවවාද ලබාදීම සිදු වේ. තවද සුභාෂිතය, ධම්ම පදය, ජාතක පොත ආදි ආගමික ග්‍රන්ථ භාවිත කරමින් කරුණු දැක්වීම තුළින් අනුශාසනා ලබාදීමේ ඇති වැදගත්කම කියාපායි. මෙයින් පැහැදිලි වන්නේ ශීල්පීය ක්‍රම භාවිතය සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා වැදගත්වන බවයි.

## 05. පුද්ගලයා ජීවිතයේ ගත කරන විවිධ අවධි අනුව සමාජානුයෝජනය වෙනස් වීම

සමාජානුයෝජන ක්‍රියාවලියෙහි දක්වා ඇති ලක්ෂණ අතුරින් පුද්ගල ජීවිතයේ ගත කරන විවිධ අවධි අනුව සමාජානුයෝජනය වෙනස් වීමේ තත්වය පැහැදිලි කරයි. මෙහිදී පුද්ගල ජීවිතේ ගත කරන අවධි සඳහා එකිනෙකට වෙනස් වූ සමාජානුයෝජන ක්‍රියාවලියක් එහි දී සිදුකෙරේ. ළදරු වියේ පසුවන ළදරුවකු සමාජානුයෝජනය කළ ආකාරයට වෙනස් වූ ආකාරයකින් ළමා අවධියේ දී සමාජානුයෝජන ක්‍රියාවලියට භාජනය වේ. තරුණ වයසේ පසුවන තරුණයෙකුට හෝ තරුණියකට හෝ සාපේක්ෂව වැඩිහිටියෙකුගේ සමාජානුයෝජන ක්‍රියාවලිය වෙනස් වේ. රුචි අරුචිකම් අනුව ද පුද්ගලයාගේ සමාජානුයෝජනය වෙනස් වේ.

ළදරු අවධියේ දී කිරි බීම ආහාර ගැනීම, දණ ගෑම ආදිය ද ළමා අවධියේ දී ආහාර පුරුදු, මළ මූත්‍ර කිරීමේ පුරුදු, අධ්‍යාපනයේ මූලික අවස්ථා හඳුනා ගැනීම ආදිය ද වටහා ගනී. තරුණ අවධියේ දී සුදුසු වෘත්තියක් තෝරා ගැනීම, ඉගෙනීම, සමාජ ගැටලු ආදියට මුහුණ දීම පිළිබඳ යම් අවබෝධයක් ලබා ගනී. විවාහය හා විවාහ ජීවිතය ද මෙයට අදාළ කර ගත හැකිය. බිහිවන දරුවන් පෝෂණය කිරීම, ආරක්ෂාව සැලසීම, අධ්‍යාපනය ලබා දීම ආදිය ද අවබෝධ කර දිය යුතුය. මේ සියල්ලක් ම පාහේ සිදුවන්නේ සමාජානුයෝජන ක්‍රියාවලිය මත පදනම්ව බව පැහැදිලිය.

**සමාලෝචනය**

මෙහිදී සාකාච්ඡාවට ලක්කරන ලද සමාජානුයෝජන ක්‍රියාවලියට අදාළ ලක්ෂණ සියල්ලක්ම පුද්ගලානුබද්ධ ආකල්පමය

සංවාදයන් බව වැටහාගත හැකිය. විශේෂයෙන්ම සමාජ කතිකාවතක් වූ සමාජානුයෝජන ක්‍රියාවලිය ජීවිතය එක් සන්ධිස්ථානයකට පත් කිරීමට තරම් සමත්ය. සමාජය වෙත යම් දෘෂ්ටිකෝණයක් හරහා පුද්ගලයකු දායාද කරවීම සමාජානුයෝජනය යනුවෙන් අර්ථකථනය කළ හැකිය. යම් පුද්ගලයෙකුගේ පැවැත්ම තීරණය කරනු ලබන මිණුම් දණ්ඩක් මෙන් එය භාවිත කිරීමට පුළුවන. සමාජය තුළ ජීවත් විය යුතු ආකාරය, අනුගමනය කළ යුතු නොකළ යුතු දෑ, කළ යුතු රැකියාව ආදී වූ අනේකවිධ අවස්ථාවන් සමෝධානය කරගැනීම සඳහා මෙම සංකල්පය බෙහෙවින් උපකාරී වේ. සමාජයක පැවැත්ම සමාජානුයෝජන ක්‍රියාවලිය මත රඳා පවතින අතර පවුල් සංස්ථාව, පාසල, ආගමික මධ්‍යස්ථාන ආදී සමාජශීලි ආයතන මගින් මෙම ක්‍රියාවලිය සඳහා ඉතා වැදගත් මෙහෙවරක් ඉටුකරයි. මෙම සංකල්පය ප්‍රධාන වශයෙන් අධ්‍යයන ක්‍රියාවලිය මත පවතී. මෙයට අදාළ කරන ආයතන මෙන්ම සුවිශේෂී පුද්ගලයන්ගේ දායකත්වය ද නිතැතින්ම හිමි වේ. මෙම සංකල්පය ලක්ෂණ රාශියකින් සමලංකෘත විෂය ක්ෂෙත්‍රයක් බවට හඳුනා ගැනීම අපහසු නොවේ. සමස්ත සමාජයක් පෝෂණය කරන, ආරක්ෂා කරන, ඉදිරියට පවත්වා ගෙන යන ඉතා වැදගත් උදාරතර ක්‍රියාවලියක් ලෙස සමාජානුයෝජනය හඳුනා ගැනීමට අපට අවස්ථාවක් උදා වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරළ, දයා (1982), *නව අධ්‍යාපන රචනා*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

අමරසේකර, දයා (1987), *සමාජ විද්‍යාවේ මූලික සංකල්ප*, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

කුලරත්න ඩබ්, ජී (2000), *අධ්‍යාපන සැලසුම්කරණය*, කොට්ටාව: සාර ප්‍රකාශන හා මුද්‍රණ.

ජයසේන, අසෝකා (1982), *අධ්‍යාපන සමාජ විද්‍යාව*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

නාහිත, මහපුලියන්කුලමේ (1998), *සමාජවිද්‍යාවේ මූලධර්ම*, කුලියාපිටිය: ඉම්ප්‍රින්ටා ඉන්වර්නැෂනල්.

රණසිංහ හේමසිරි. (2004). *විශිෂ්ට පාසලක් සඳහා අධ්‍යාපන සැලසුම්කරණය*, කතෘ ප්‍රකාශන.

රස්නැක්, බෙන් (1996), *අධ්‍යාපනය හා ජීවිතයේ අරුත*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිසේන, එස් (1999), *ශ්‍රී ලංකා අධ්‍යාපන ප්‍රතිපත්ති පරමාර්ථ හා අරමුණු*, කොළඹ ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික් ආයතනය.

සේනාධීර, සිල්වී හේවාපතිරණ චිත්‍රාංගනී (2010), *සමාජානුයෝජන කාරකවල වැදගත්කම*. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි කුමාරදාස. (2000). *විසිඑක්වන ශතවර්ෂය සඳහා අධ්‍යාපනය*, කොළඹ: ඇස්. ගොඩගේ

සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, ධර්මසේන (2001), *බෞද්ධ සමාජවිද්‍යා ප්‍රවේශය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.